ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2024.08.16

වින්දිත පාර්ශවය : 01. අඹවලගේ කීර්තිරත්න සිල්වා මයා
අංක 199, තිඹිරිගස්යාය පාර
කොළඹ 05.

වගඋත්තර පාර්ශවය : 01. ස්ථානාධිපති (වෙනුවට)
ඩබ්.ජී.එස්.එල්.දිවිසේකර මයා
මූලස්ථාන පොලිස් ස්ථානය,
ගල්කිස්ස.

02. පොලිස් සැරයන් 61189 පී.එම්.ජේ.කේ.රත්නායක මයා,
මූලස්ථාන පොලිස් ස්ථානය,
ගල්කිස්ස.

03. පොලිස් සැරයන් 53685 මනෝජ් හේවනායක මයා,
මූලස්ථාන පොලිස් ස්ථානය.
ගල්කිස්ස.

04. පොලිස් සැරයන් 55985 ඩී.ජේ.වමින්ද නොයෙල් මයා (උපසේවක),
මූලස්ථාන පොලිස් ස්ථානය ,
ගල්කිස්ස.

පැමිණිලි අංකය : **HRC/SUO/MOTU/03/24**

පැමිණිල්ල

අංක 199, තිඹිරිගස්යාය පාර,කොළඹ 05 ලිපිනයේ පදිංචි අඹවලගේ කීර්තිරත්න සිල්වා (වයස අවු.58) යන අය සොරකමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ගල්කිස්ස මූලස්ථාන පොලිස් ස්ථානය භාරයේ සිටියදී 2024.01.09 වන දින මිය යාම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්ෂණික දුරකථනය වෙත ලද ඇමතුමකට අනුව පැමිණිලි අංක HRC/SUO/MOTU/03/24 යටතේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්ව මෙහෙයවීමෙන් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. එහි දී අදාළ වගඋත්තරකරුවන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමට ක්‍රියාකර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම**

වගඋත්තරකාර පාර්ශවයේ ගල්කිස්ස මූලස්ථාන පොලිසියේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකගේ 2024/02/28 හා 2024/03/21 දිනැති වාර්තා මඟින් මෙම පැමිණිල්ලට අදාළ කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2024.01.08 වන දින මූලස්ථාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ පො.සැ. 61189 රත්නායක හා පොලිස් කොස්තාපල් 90026 ගමගේ, පොලිස් කොස්තාපල් 101704 කුමාර, පොලිස් කොස්තාපල් 101354 පව්දාස් සහ පොලිස් කොස්තාපල් රියදුරු 80193 කුලරත්න ඇතුලු නිලධාරීන් කණ්ඩායම විසින් අංක WP GB 8451 දරණ ජීප් රථයෙන් රාත්‍රී ජංගම රාජකාරියේ යෙදී සිටියදී, 2024.01.09 වන දින පැය 03.45 ට ගල්කිස්ස පීරිස් පාර බෝගස අසල දී අංක 119. තිඹිරිගස්යාය පාර, කොළඹ 05 ලිපිනයේ පදිංචි වයස අවු 58 ක් වන අඹවලගේ කීර්තිරත්න සිල්වා යන අය සොරකමට සැකපිට අත්අඩංගුවට ගෙන ස්ථානයේ උපසේවක පොලිස් කොස්තාපල් 82512 කුමාර නිලධාරියාට පැය 5.30ට භාරදී ඇති බවත්,

අනතුරුව ඉහත නම් සඳහන් සැකකරු භාරගැනීමට අදාළ උපසේවා නිලධාරි පොලිස් කොස්තාපල් 821512 කුමාර නිලධාරියා විසින් 2024.01.09 වන දින දිවා උපසේවා රාජකාරී භාරගත් පො.සැ. 55985 නොයෙල් නිලධාරියාට සැකකරු පැය 6.29ට භාර දී ඇති බවයි. මෙම සැකකරු සමඟ සැකකරුවන් 38 දෙනෙකු සිර මැදිරියේ රඳවා තබා ඇති අතර සැකකාරියන් 04 දෙනෙකු උපසේවක භාරයේ සිට ඇත. එම සැකකරුවන් හා සැකකාරියන් 38 දෙනෙකු එදින ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා පැය 12.35ට රැගෙන යාමෙන් අනතුරුව මෙම සැකකරු සමඟ තවත් සැකකරුවන් තුන් දෙනෙකු සිර මැදිරියේ රඳවා තබා ඇති අතර පසුව කොට්ඨාශ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් මෙම සිදුවීමට පෙර තවත් සැකකරුවන් 6 දෙනෙකු අත්අඩංගුවට ගෙන උපසේවක වෙත භාර දී ඇත.

හෙරොයින් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ස්ථානයේ රඳවාගෙන සිටි සැකකරුවෙකු වන බී.ජී.එන්.පී.වීරසිංහ යන අය විසින් 2024.01.09 වන දින පැය 14.50ට පමණ උපසේවා රාජකාරියේ යෙදී සිටි පොලිස් සැරයන් 55985 නොයෙල් නිලධාරියා හට ප්‍රකාශ කර ඇත්තේ තමා සිටින සිරමැදිරියේ රඳවාගෙන සිටින එක් සැකකරුවෙකු ඇඳ සිටි කලිසමේ ඉන තද කිරීමට භාවිතා කරන ලද නූලකින් ගෙල වැලලාගෙන ඇති බවයි. එම දැනුම්දීම අනුව පොලිස් සැරයන් 55985 නොයෙල් නිලධාරියා වහා ක්‍රියාත්මක වී සිරමැදිරියට ගොස් ගෙල වැලලාගෙන සිටි පුද්ගලයා කකුල් දෙකෙන් උස්සාගෙන ස්ථානයේ අනෙක් නිලධාරින්ගේ උපකාර ඉල්ලා ඇති බවත් දක්වා ඇත.

ඒ අනුව ස්ථානයේ කාර්යභාර නිලධාරි පොලිස් සැරයන් 53685 මනෝජ් නිලධාරියා විසින් කතුරක් ගෙනවිත් දිවා ජංගම සංචාර රාජකාරි යෙදී සිටි උප පොලිස් පරීක්ෂක උපුල් නිලධාරියාගේද සහාය ඇතිව සැකකරු ගෙල වැලලා ගෙන සිටි නූල කපා සැකකරු උප පොලිස් පරීක්ෂක උපුල් නිලධාරියා භාරයේ දිවා ජංගම සංචාරයෙන් කලුබෝවිල රෝහලට රැගෙන ගොස් හදිසි අනතුරු ඒකකයට ඇතුලත් කර ඇති අතර හදිසි අනතුරු ඒකකයේ වෛද්‍යවරුන් විසින් මෙම සැකකරු මිය ගොස් ඇති බවට ප්‍රකාශ කර ඇති බවය.

2024.01.09 වන දින මෙම මරණය සම්බන්ධයෙන් ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවිය බී 28702/24 යටතේ අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මෙම මියගිය සැකකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර එම වාර්තාව ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමටත්

පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසුව සැකකරුගේ මෘත දේහය ඥාතීන්ට භාරදීමට නියෝග කරන ලද බව දක්වා ඇත.

ඒ අනුව ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ඇති අතර එම විමර්ශනයේ දී සැකකරු ගෙල වැලලාගෙන මියගොස් ඇති බවට අධිකරණ වෛද්‍ය නිලධාරි පී.බී.දසනායක මහතා විසින් තීරණය කර මරණ පරීක්ෂණ වාර්තාවද ලබා දීමෙන් පසුව සැකකරුගේ ඥාතීන් වන (බිරිඳ) අංක 142/15,තිඹිරිගස්යාය පාර ,කොළඹ 05 ලිපිනයේ පදිංචි මඩපාතගේ දෝන තිළිණි රුක්මාලි සහ මරණකරුගේ වැඩිමහල් සහෝදරිය වන අංක 60/4/ඩී, සමගි මාවත, අත්තිඩිය දෙහිවල ලිපිනයේ පදිංචි ලලිතා අබේනායක යන අය විසින් මරණකරුගේ මෘතදේහය හඳුනාගැනීමෙන් පසුව මෘත දේහය ඔවුන්ට භාර දී ඇති බවයි.

ඒ අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයෙහි සහභාගිත්වයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේදී 2024.03.01 දින පරීක්ෂණයක් පවත්වා ඇත. එහි දී සිද්ධියට සම්බන්ධ පහත නම් සඳහන් පොලිස් නිලධාරීන් වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් (ගල්කිස්ස මූලස්ථාන පොලීසිය) පෙනී සිට ප්‍රකාශ සටහන් කොට ඇත.

1. ඩබ්.ජී.එස්.එල්.දිවිසේකර මයා (ස්ථානාධිපති (වෙනුවට)) - මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා නඩුවක් සඳහා කොළඹ මහාධිකරණයට එදින පෙනී සිටීමට නියමිත වී තිබූ බැවින් මෙම නිලධාරියා හට බලය පවරා ඇත.
2. පොලිස් සැරයන් 61189 පී.එම්.ඒ.කේ.රත්නායක මයා
3. පොලිස් සැරයන් 53685 මනෝජ් හේවනායක මයා
4. පොලිස් සැරයන් 55985 D.A.චමින්ද නොයෙල් මයා (උපසේවක)

ගල්කිස්ස පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ පොලිස් සැරයන් 61189 පලිස්කාල මුදියන්සේලාගේ ආසිරි කුමාර රත්නායක විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ 2024/01/08 දින පැය 17.55ට මූලස්ථාන පොලිස් පරීක්ෂක හා අපරාධ අශයේ ස්ථානාධිපතිතුමාගේ උපදෙස් පරිදි නියෝග අංක 15/2024 අනුව පොලිස් සැරයන් පො.කො. 90026 ගමගේ, පො.කො. 101704 කුමාර, පො.කො. 101354 පවිදාස්, පො.කො.රියදුරු 80193 කුලරත්න නිලධාරියා පදවන ලද අංක WP GB 8451 දරණ ජීප් රථයෙන් අපරාධ අංශයේ රාත්‍රී ජංගම සංචාරයක් සඳහා පිටව ගිය බවය. එසේ සංචාරයෙ යෙදී සිටින අතරතුර 2024/01/09 වන දින පෙ.ව. 3.45ට පීරිස් පාර බෝගහ අසළ නවතා තිබූ බස් රථයක් අසළ සිටි පුද්ගලයෙකු පොලිස් ජීප් රථය දැක මගහැරිමට උත්සාහ කළ අවස්ථාවේ ඔහු පරීක්ෂා කර අනන්‍යතාව තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත හෝ වෙනත් කිසිවක් නොතිබූ බැවින් ප්‍රශ්න කළ බවත් එසේ ප්‍රශ්න කරන විට පැටලිලි සහගත ලෙස පිළිතුරු ලබා දුන් බැවින් යම් අපරාධයක් කිරීමට පැමිණ ඇතැයි යන සැකය අනුව සොරකමට සැකපිට අංක 199, තිඹිරිගස්යාය, කොළඹ 05 යන ලිපිනයෙහි පදිංචි අඹවලගේ කීර්තිරත්න යන පුද්ගලයා පැය 3.45ට පමණ අත්අඩංගුවට ගෙන ඇති බවයි. සැකකරු සන්තකයේ සැකකටයුතු කිසිවක් නොතිබූ බවත් පිටතින් පෙනීමට තුවාල කිසිවක් නොතිබූ බවත් ප්‍රකාශ කරන ලදී. තවද සැකකරු අත්අඩංගුවට ගැනීමේදී යම් අවම බලයක් යෙදීමට අවශ්‍ය නොවූ බවත්, සැකකරු කලහකාරී ලෙස හැසිරුනේ නැති බවත් ප්‍රකාශ කරන ලදී. පසුව සංචාරය අවසන් කර නැවත ස්ථානයට පැමිණ පැය 5.30ට පමණ මෙම සැකකරු උපසේවක පො.කො. 82512 කුමාර නිලධාරියාට භාර කර ඇති බවය.

පොලිස් සැරයන් 55985 දන්දෙණිය ආරච්චිගේ චමින්ද නොයෙල් නිලධාරියා කොමිසන් සභාව හමුවේ ප්‍රකාශ කර සිටියේ තමා 2024/01/09 වන දින ගල්කිස්ස පොලිස් ස්ථානයේ උප සේවක රාජකාරියේ පැය 6.29ට ආරම්භ කල බවත් භාර ගන්නා අවස්ථාවේ සැකකරුවන් 37 සහ සැකකාරියන් 3 සිටි බවයි. ඒ අතරතුර තවත් සැකකාරියක් සහ සැකකරුවෙකු ඉදිරිපත් කළ බවත් ඉන් සැකකරුවන් 38 දෙනෙකු ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියට පැය 12.35ට රැගෙන ගිය බවත්

සැකපිට ගන්නා ලද සැකකරුවන් 4 දෙනෙකු පමණක් සිරමැදිරියේ සිටි බවත්ය. ඉන් දෙදෙනෙකුට මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝග අනුව ඇප ලබා දුන් බවත් ඉන් පසුව සිර මැදිරියේ ඉතිරි වී ඇත්තේ බී.වයි. චන්ද්‍රකුමාර සහ ඒ.කේ.ආර්.සිල්වා යන අයවලුන් පමණක් බවයි. ඒ අතරතුර තවත් සැකකරුවන් 6 දෙනෙකු 14.45ට ස්ථානයට ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී. මින් එක් සැකකරුවෙකු සිරමැදිරියේ වැසිකිලිය දෙසින් දිවවිත් පැමිණ එක්කෙනෙක් බෙල්ල වැල දාගෙන ඉන්නවා යැයි පැවසූ බවත් ඒ අනුව තමා දිව ගොස් සිර මැදිරියේ දොර විවෘත කර බැලීමේදී අඹවලගේ කීර්තිරත්න සිල්වා නමැති සැකකරු සිරමැදිරියේ වැසිකිළියේ උලුවස්ස අසල ගෙල වැලලා ගෙන සිටි බවත් තමා හැකි ඉක්මනින් අනෙකුත් නිලධාරීන් හා සැකකරුවන්ගේ සහාය ලබා ගෙන කතුරකින් ගෙල වැලලාගෙන සිටි රෙදි පටිය කපා කලුබෝවිල රෝහලට රැගෙන ගිය බවත්ය. එම අවස්ථාවේ ගෙලවැලලාගත් සැකකරුගේ හුස්ම වැටෙන බවක් නිරීක්ෂණය වූ බවද ප්‍රකාශ කරන ලදී. එම සැකකරු තමා විසින් භාර ගන්නා අවස්ථාවේදී සැකකරු පරීක්ෂා කළ බවත් බාහිරින් කිසිදු තුවාලයක් නිරීක්ෂණය නොවූ බවත් ප්‍රකාශ කන ලදී.

පොලිස් සැරයන් 53685 මනෝජ් හේවනායක නිලධාරියා කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටියේ 2024/01/09 වන දින පැය 6.22 ට ගල්කිස්ස පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරී ලෙස තමා රාජකාරියට වාර්තා කළ බවත් රාජකාරී භාර ගැනීමට පෙර අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලූ බවත් උප සේවක වශයෙන් පො.කො. 82512 කුමාර නිලධාරියා රාජකාරියේ යෙදී සිටි බවත් මෙම අවස්ථාවේ අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් 37 සහ සැකකාරියන් 3 උපසේවක භාරයේ සිටි බවත් ප්‍රකාශ කරන ලදී. එසේ රාජකාරියේ යෙදෙමින් සිටියදී මත්ද්‍රව්‍ය හා වෙනත් අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් අධිකරණයට රැගෙන යාම සඳහා අධිකරණ කටයුතු සිදුකරන නිලධාරීන් පැමිණ තොරතුරු ලබා ගත් බවද ප්‍රකාශ කර සිටී. තමා රාජකාරියේ යෙදී සිටි අවස්ථාවේ ස්ථාන භාරයේ සිටින සැකකරුවන්ට ආහාර හා බීමට ජලය උපසේවක නිලධාරියා විසින් ලබා දුන් බවත් තමා විටින් විට එම සැකකරුවන් සම්බන්ධයෙන් සොයා බැලූ බවත් එම සැකකරුවන් අතරින් කිසිදු සැකකරුවෙකු විශේෂ අසනීප තත්වයක හෝ වෙනත් විශේෂ ප්‍රශ්නයක් ඇති බවට උපසේවක නිලධාරියාට හෝ තමාහට කිසිදු දැනුම්දීමක් සිදු නොකළ බවත් ප්‍රකාශ කර සිටී. සැකකරුවන්ගේ ඇඳුම් ඉවත් කර සැකකරුවන්ගේ තුවාල පරීක්ෂා කිරීමක් තමා විසින් සිදු නොකළ බවද ප්‍රකාශ කර සිටී. එසේ රාජකාරී කරමින් සිටිය දී පැය 12.35ට පමණ මෙම සැකකරුවන්ගෙන් සැකකරුවන් 34ක් හා සැකකාරියන් 4ක් ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවිය වෙත ඉදිරිපත් කිරීමට රැගෙන ගිය බවත් ඉන්පසුව සිරමැදිරියේ ඉතිරි වී ඇත්තේ සැකපිට අත්අඩංගුවට ගෙන ස්ථානයේ රඳවා සිටි සැකකරුවන් 4ක් පමණක් බවයි. එම අවස්ථාවේ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා ස්ථානයේ නොසිටි බැවින් වැඩබලන මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගෙන් උපදෙස් පරිදි AMIS දත්ත හා ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු වෙනත් චෝදනාවලට අයත් නොවන සැකකරුවන්ට ඇප ලබා දෙන ලෙස උපසේවක පොලිස් සැරයන් 55985 නොයෙල් නිලධාරියාට පැය 2.15ට පමණ දැනුම් දී ඇති බව ප්‍රකාශ කරන ලදී. පසුව තමා දිවා ආහාරය ලබා ගැනීම සඳහා භෝජනාගාරයට ගිය බවත් දිවා ආහාරය ලබා ගැනීමෙන් පසුව නැවත රාකාරී සඳහා පැමිණෙමින් සිටියදී ස්ථානයේ කලබලකාරී තත්වයක් ඇති වී තිබෙන බව පෙනී ගිය බවත් උපසේවක සිටි ස්ථානයට ඉක්මනින් දිව ආ බවත් ප්‍රකාශ කළේය. ඒ අවස්ථාවේදී උප සේවක පො.සැ. නොයෙල් නිලධාරියා සැකකරුවෙකු ගෙලවැලලාගෙන ඇති බව තමා වෙත දැනුම් දුන් බවත් එම අවස්ථාවේ එතැන සිටි උප පොලිස් පරීක්ෂක උපුල් මහතා හැකි ඉක්මනින් සිර මැදිරියේ ඉබි යතුර හැර සිරමැදිරයේ ඉතිරිව සිටි සැකකරුවන්ගේද සහාය ඇතිව ඇතුළට ගොස් එක් සැකකරුවෙකු ඔසවාගෙන පැමිණි බවයි. එම අවස්ථාවේදී සැකකරුගේ ගෙලේ තුලක් තිබූ බවත් එය සැකකරු ගෙලවැලලා ගත් තුල බවට තමා හඳුනා ගත් බවත් එවිට සැකකරු හුස්ම ගන්නා බව දුටු බවත් ප්‍රකාශ කළේය. උප පොලිස් පරීක්ෂක උපුල් මහතා සහ උප සේවක පො.සැ. නොයෙල් නිලධාරියි විසින් සැකකරු ඔසවාගෙන ගොස් එදින ජංගම සංචාරයේ යොදවා සිටි WP LD 3902 දරන

කැබ් රථයෙන් හැකි ඉක්මනින් කලුබෝවිල රෝහලට රැගෙන ගිය බවත් ප්‍රකාශ කර සිටී. එම රථය පදවා ඇත්තේ පො.කො.රි. 27005 සෙනවිරත්න නිලධාරියා විසින්ය.

මූලස්ථාන පොලිස් පරීක්ෂක ගල්කිස්ස වෙනුවෙන් උප පොලිස් පරීක්ෂක ඩබ්.ජී.එස්.එල්.දිවිසේකර නිලධාරියා කොමිෂන් සභාව ප්‍රකාශ ඉදිරියේ ලබා දෙමින් සඳහන් කරන ලද්දේ මූලස්ථාන පොලිස් පරීක්ෂක මහාධිකරණ නඩුවක් සදහා පෙනී සිටීමට ගොස් ඇති බැවින් කොමිසම ඉදිරියේ පෙනී සිටින ලෙස තමාට ලබා දුන් උපදෙස් පරිදි තමා ආ බවත් මෙම සිද්ධියට සම්බන්ධ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් හෝ මෙම සිදුවීම සම්බන්ධයෙන් කිසිදු වගකීමක් තමා හට පැවරී නොමැති බවත්ය.

2024/08/08 දින නැවත වගඋත්තරකරුවන් කොමිසම හමුවේ කැඳවන ලද අතර ප්‍රකාශ ලබා දී ඇත.

එහිදී 2වන වගඋත්තරකරු ලෙස පැමිණ සිටි 61189 පලිස්කාර මුදියන්සේලාගේ ආසිරි කුමාර රත්නායක විසින් අදාල රාජකාරිය සම්බන්ධයෙන් සටහන් යොදා ඇති G.C.I.B. (02) පිටුව 151, ඡේදය 175, සටහන් කොලය 61 යටතේ සටහන් යොදා ඇත්තේ සොරකමකට සැක පිට මෙම සැකකරුව අත්අඩංගුවට ගත් බවටය. මේ පිළිබඳ 2වන වගඋත්තරකරු පිළිතුරු ලබා දී ඇත්තේ මෙම සටහන්හි අතපසු වීමෙන් සොරකමට සැකපිට ලෙස සඳහන් වී ඇති බවත්, නමුත් රඳවා තබා ගැනීමේ ලේඛනයේ සැකපිට ලෙස සටහන් කර ඇති බවත්ය.

4 වන වගඋත්තරකරු 55985 දන්දෙණිය ආරච්චිලාගේ චමින්ද නොයෙල් (උප සේවක) ප්‍රකාශයක් ලබා දෙමින් කියා ඇත්තේ 2024.01.09 වන දින උපසේවා රාජකාරි භාර ගන්නා අවස්ථාවේදී සිරමැදිරියේ සැකකරුවන් 37 දෙනෙක් හා සැකකාරියන් 3 දෙනෙක් සිටි බවත් එදින උදෑසන 10 ට පමණ එයින් සැකකරුවන් 38 දෙනෙක් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත්ය. එම සැකකරුවන් 38 දෙනා විෂ මත්ද්‍රව්‍යා සහ වරෙන්තු වරදවල් යටතේ අත්අඩංගුවට ගත් අය බවයි. ඉහත සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කල පසුව සැකකරුවන් 4 දෙනෙක් සිරමැදිරියේ රඳවා සිටි බවත් එම සැකකරුවන් සැකපිට අත්අඩංගුවට ගත් සැකකරුවන් බවටත් කරුණු දක්වන ලදී. එම සැකකරුවන් පොලිස් ඇප මත මුදා හැරීමට හෝ අධිකරණයට ඉදිරිපත් කිරීම සිදු නොකලේ මන්ද යන්න සම්බන්ධයෙන් විමසීමේදී මෙම සැකපිට රඳවා සිටි සැකකරුවන් වෙනත් අපරාධයන්ට සම්බන්ධ දැයි AIMS ( Arrested Monitoring and Information System) තාක්ෂණයෙන් පරීක්ෂා කිරීමට කටයුතු කරන බවත්, ඒ අනුව ඇප දීම හෝ ඉදිරි විමර්ශන කටයුතු සිදු කරන බවයි. ඒ වන විට අදාල සැකකරුවන් අපරාධ වලට සම්බන්ධ ද නැද්ද යන තොරතුරු පොලිසිය වෙත ලැබී නොතිබූ බවත් මෙම සැකකරුවන් ගෙන් ප්‍රනාන්දු යන සැකකරුට අදාල තොරතුරු ලැබීමෙන් පසු පැය 14.30 ට ඇප ලබා දීමක් සිදු කල බවයි. ඉන් පසුව තවත් සැකකරුවන් 6 දෙනෙක් පැය 14.45ට උපසේවක භාර ගත් බවත්, එම සැකකරුවන් ද මත්ද්‍රව්‍යා සම්බන්ධයෙන් සැකකරුවන් බව ප්‍රකාශ කරයි. තවද, සැකපිට රඳවා සිටි අනිත් සැකකරුවන් 3 දෙනාගේන් එක් අයෙකු වන බී.සී.වී.කේ පෙරේරා යන අයට පැය 13.50ට ඇප ලබා දීමක් සිදු කරන ලැබූ බව ප්‍රකාශ කරයි. එසේම සැකපිට රඳවා සිටි අනෙක් සැකකරුවා වන චන්ද්‍ර කුමාර යන අයට තමාගෙන් පසු උපසේවය භාර ගත් නිලධාරියා විසින් පැය 20.15 ට ඇප ලබා දී ඇති බවට ප්‍රකාශ ලබා දී ඇත.

මේ අනුව කොමිසම හමුවේ පහත සඳහන් කරුණු අනාවරණය වී ඇත.

- ගල්කිස්ස පොලිසියේ පොලිස් සිරමැදිරියේදී මිය ගිය අඹවලගේ කීර්තිරත්න සිල්වා යන අය අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ඔහු සන්තකයේ තිබී තහනම් ද්‍රව්‍යක් හෝ සොර බඩුවත් සොයා ගැනීමක් සිදු නොවූ බවත් සැකකරුට අනන්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි වීම හා සැකකටයුතු ලෙස හැසිරීම නිසාත් පොලිසියට නිසි පිළිතුරු ලබා නොදීම මත ඇති වූ සැකය නිසාත් සැකපිට අත්අඩංගුවට ගත් බවට කරුණු අනාවරණය වී ඇත.

- පොලිස් නියෝග ඒ20 2(ඊ) යටතේ යටත් පිරිසෙයින් දෙපැයකට වරක් උපසේවා රාජකාරියේ නියුක්ත නිලධාරීන් හිරකාමරවල සිටින රැඳවියන් බැලීමට යායුතු වේ. පොලිස් සැරයන් 53685 මනෝජ් හේවනායක නිලධාරියා කොමිෂන් සභාව ඉදිරියේ සිදු කර ඇති ප්‍රකාශයෙන් දැක්වෙන්නේ තමා රාජකාරියේ යෙදී සිටි අවස්ථාවේ ස්ථාන භාරයේ සිටින සැකකරුවන්ට ආහාර හා බීමට ජලය උපසේවක නිලධාරියා විසින් ලබා දුන් බවත් තමාද විටින් විට එම සැකකරුවන් සම්බන්ධයෙන් සොයා බැලූ බවත්ය. තවද 2024/01/10 වන දින කොමිෂන් සභාව විසින් සිද්ධිය සම්බන්ධයෙන් සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී උපසේවක මහතා එම අවස්ථාවේ නොසිටි බැවින් ස්ථානභාර නිලධාරී ලෙස පොලිස් සැරයන් 53685 මනෝජ් හේවනායක නිලධාරියා විසින් ප්‍රකාශ ලබා දී ඇත්තේ පස්වරු 12.45ට පමණ දිවා ආහාරය ලබා දෙන අවස්ථාවේදී වින්දිතයා කිසිදු මානසික ව්‍යාකූලත්වයක් හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවන් හෝ මත්ද්‍රව්‍ය පාවිච්චි කළ පුද්ගලයෙකු ලෙස නොහැසිරුණු බවටය.

- ගල්කිස්ස මූලස්ථාන පොලිසියෙ 2024/03/21 දිනැතිව යොමු කරන ලද වාර්තාවේ පොලිස් උද්ධෘත සටහන් පරීක්ෂා කිරීමේදී මරණකරු සමග සිරමැදිරියෙහි රඳවා සිටි පමුණුවිට ගමගේ ගමගේ නිලාන් ප්‍රියමන්ත වීරසිංහ, අත්නායක මුදියන්සේලාගේ සේනාරත්න, ලිදමුලගේ ප්‍රියන්ත සිල්වා, අබ්දුල් සමන් නසීර්, රාජලිංගම් ශිවරාජා යන අයගේ ප්‍රකාශ සටහන් තුළින් මරණකරු ගෙලවැලලාගෙන සියදිවි නසා ගෙන ඇති අයුරු නිරීක්ෂණය වූ බවට කරුණු ඉදිරිපත් වී ඇත. එම සැකකරුවන් සියලුදෙනා මත්ද්‍රව්‍ය භාවිත කිරීම හෝ සන්තයේ තබා ගැනීම යන වරදට අත්අඩංගුවට ගෙන ඇති බවට කරුණු අනාවරණය වී ඇත.

- ගල්කිස්ස මූලස්ථාන පොලිසියෙ 2024/03/21 දිනැතිව යොමු කරන ලද වාර්තාවේ පොලිස් උද්ධෘත සටහන් පරීක්ෂා කිරීමේදී මරණකරුගේ මරණය සම්බන්ධයෙන් පවුලේ ඥාතීන්ට සැකයක් නොමැති බව හඳුනා ගත හැකිවිය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා මරණකරුගේ බිරිඳ වන එම්.ඩී.ටී.ආර්. රුක්මලී මිය වෙත කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට 2024/05/02 දිනැති ලිපිය මගින් දැනුම් දුන්නද කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත් වී ඇත.

- මරණකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව ඔහුගේ ශරීරයේ තුවාල සලකුණු (තැලීම් සහ සීරීම්) කිහිපයක් හඳුනා ගෙන ඇති අතර අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී අත්අඩංගුවට ගන්නා ලද නිලධාරියා විසින් ඔහුගේ ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී බාහිරින් තුවාල කිසිවක් නොතිබුණ බවයි. අත්අඩංගුවට ගැනීම සඳහා අවම බලයක් යෙදීමට අවශ්‍ය නොවූ බවත්, සැකකරු කලහකාරී ලෙස හැසිරුනේ නොමැති බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ වෙනත් බාහිර පාර්ශවයක් විසින් පහරදීමක් සිදු කර නොමැති බවටත් වගඋත්තකරුවන් විසින් ප්‍රකාශ සටහන් ලබා දී ඇත. එම කාල සීමාව තුළ සැකකරු පොලිස් ස්ථානයෙන් බැහැර වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. ඒ අනුව පොලිස් සථානය තුළදී හෝ පොලිස් අත්අඩංගුවේ සිටියදී එම තුවාල සිදුවූවා යැයි අනුමාන කිරීමට යම් හැකියාවක් ඇත.

  එහෙත් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අධ්‍යයනය කිරීමේදී මරණයට හේතුව ගෙලවැලලා ගැනීමක් ලෙසත් බෙල්ලේ බන්ධන සලකුණ හැර අනෙකුත් තුවාල අවසන් මොහොතේ ඇති වූ කැළඹීම් හේතුවෙන් හා මරණයට මොහොතකට පෙර සහ /හෝ මරණය අතරතුර අවට ව්‍යුහයන් සමඟ ශරීරයට ඇති වූ බලපෑම් හේතුවෙන් සිදු වූ ඒවා විය හැකි බවටද දක්වා ඇත. එම තුවාල මරණය ඇති කිරීමට තරම් බරපතල ඒවා නොවන ලෙසටද හේතු පහදා ඇත.

**<u>නිගමනය</u>**

මෙම සිද්ධිය සම්බන්ධයෙන් ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියේ බී 28702/2024 යටතේ අධිකරණයට කරුණු වාර්තා කර, මෙම මරණය සම්බන්ධයෙන් 2024.01.10 වන දින මරණ පරීක්ෂණ කටයුතු සිදු කිරීමෙන් අනතුරුව ගෙලවැලලා ගැනීමෙන් මෙම මරණය සිදු වී ඇති බවට තීන්දුව ලබා දී ඇත. තවදුරටත් මරණකරු වදහිංසාවට ලක් කළ බවට සාක්ෂි ඉදිරිපත් වී නොමැති වීම හා මරණකරුගේ පවුලේ ඥාතීන්ට මරණය සම්බන්ධයෙන් සැක කටයුතු කිසිවක් නොමැති වීම යන කරුණු අනාවරණය වේ. ඒ අනුව අධිකරණයෙහි තීන්දුවට යටත්ව ගොනුවේ කටයුතු අවසන් කරනු ලැබේ.

පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.01.11 දින කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාව අනුව ගල්කිස්ස මූලස්ථාන පොලිස් සිරමැදිරියෙහි ප්‍රමාණය ඉක්මවා සැකකරුවන් රඳවා තබා ගැනීම හේතුවෙන් ඔවුන්ට අවම පහසුකම් හා මූලික අවශ්‍යතාවයන් පවා නිසි පරිදි ඉටු කර ගැනීමට නොහැකි බව නිරීක්ෂණය වූ අතර සිරමැදිරියේ පිහිටීම අනුව සිරමැදිරියෙහි ඇතුළත, පිටත සිටින උපසේවක මහතා වෙත නිරාවරණය නොවීම යන කරුණුද නිරීක්ෂණය වී ඇත. පොලිස් නියෝග ඒ 20 5(ඊ) ප්‍රකාරව යටත් පිරිසෙන් දෙපැයකට වරක්වත් උපසේවා රාජකාරියේ නියුක්ත පොලිස් නිලධාරියා සිරකාමරවල සිටින තැනැත්තන් බැලීමට යායුතු වේ. එහිදී උපසේවකට ඍජුව අධීක්ෂණය වන ආකාරයට සිරකාමරය පිහිටා තිබුණේ නම් මෙම මරණකරු ගෙලවැලලා ගැනීම සම්බන්ධයෙන් පූර්ව නිරීක්ෂණය වීමක් හෝ ඒ සම්බන්ධයෙන් යම් අවබෝධයක් ලබා ගැනීමට හැකියාවක් පැවති බවද පෙනී යයි.

**<u>නිර්දේශය</u>**

ඒ අනුව සියලුම පොලිස් ස්ථානයන්හි සැකකරුවන් රඳවාතබා ගන්නා සිරමැදිරි උපසේවකට ඍජුව අධීක්ෂණය වන ආකාරයට උපසේවක ස්ථානගත කිරීම අත්‍යවශ්‍ය කරුණක් වන බවට සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමට හා එලෙස කටයුතු කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීමට පොලිස්පතිවරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

2024.10.16 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත මෙයින් දන්වා සිටිමු.

| | |
|---|---|
| **එල්.ටී.බී. දෙහිදෙණිය,**<br>**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),**<br>**සභාපති,**<br>**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**<br>විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)<br>සභාපති<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | **නිමල් ජී. පුංචිහේවා,**<br>**කොමසාරිස්,**<br>**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**<br>නිමල් ජී. පුංචිහේවා<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ<br>කොමසාරිස්<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |

| | | | |
|---|---|---|---|
| පිටපත : | 01. | අමාත්‍යතුමා<br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය,<br>4වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. | දැනගැනීම සඳහා |
| | 02. | පොලිස්පති<br>පොලිස් මූලස්ථානය,<br>කොළඹ 01. | අවශ්‍ය පියවර ගැනීම සඳහා |